**ලංකා පොස්පේට් ලිමිටඩ් (රාජ්‍ය සමාගම) - 2016/17**

**-----------------------------------------------------**

ලංකා පොස්පේට් ලිමිටඩ් (රාජ්‍ය) සමාගමේ 2017 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ ඇතුළත් කර ඇත.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

**----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ (“අධ්‍යක්ෂ මණ්ඩලය”) වගකීමවේ.

**1.3 විගණකගේ වගකීම**

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

**2. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**2.1 මතය**

**-------**

සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලින් 2017 මාර්තු 31 දිනට ලංකා පෝස්පේට් ලිමිටඩ් (රාජ්‍ය) සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

**ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රමිතයේ 34 ඡේදය ප්‍රකාරව, සමාගමේ දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය නොකිරීම හේතුවෙන් 2017 මාර්තු 31 දිනට එකතුව රු. 328,289,853 ක ධාරණ අගයක් සහිත වත්කම්වල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශන තුළ නිරූපනය නොවුණි.

(ආ) ප්‍රමිතයේ 37 ඡේදය ප්‍රකාරව, අස්ථිත්වයක මෙහෙයුම්වල එකම ස්වභාවයේ හා එකම භාවිතයෙන් යුතු වත්කම් එකම කාණ්ඩයක් යටතේ හඳුනාගත යුතු වුවත්, ඊට පටහැනි ලෙස විවිධ ස්වභාවයේ හා වෙනස් ආර්ථික ජීව කාලයක් සහිත පිරිවැය රු. 11,283,522 ක්වූ වත්කම්, විවිධ වත්කම් ලෙස හඳුනාගෙන ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබීම නිසා ගණනය කරන ලද වාර්ෂික ක්ෂය වටිනාකම නිවැරදි නොවුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

ඉකුත් වර්ෂයට අදාළ යන්ත්‍ර උපකරණ කුලියට ගැනීමේ වියදම් රු.3,055,620 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත කර තිබුණි.

### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විගණනය විසින් ලබා ගත් සෘජු සනාථ කිරීම් සහ මූල්‍ය ප්‍රකාශනවල ණයගැති ශේෂයන්ගේ පහත පරිදි එකතුව රු.1,192,594 ක නොසැසඳීම් නිරීක්ෂණය විය.

| ණයගැති ආයතනය | සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය | ශේෂ සනාථ කිරීම් අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| රාජ්‍ය වැව්ලි සංස්ථාව | 1,237,280 | 1,684,528 | 447,248 |
| තේ ශක්ති අරමුදල | 79,200 | -- | 79,200 |
| ලක් පොහොර සමාගම | 666,146 | -- | 666,146 |
| | | | 1,192,594 |

(ආ) ණයගැති පාලන ගිණුම හා ණයගැති උප ලෙජරයේ දැක්වෙන ශේෂ අතර දීර්ඝ කාලයක සිට රු. 240,397 ක වෙනසක් පැවතුණි.

**2.3 ලැබිය යුතු ගිණුම්**

--------------------

2017 මාර්තු 31 දිනට රු.43,903,244ක් වූ ණයගැති ශේෂය තුළ වසර 05 ඉක්ම වූ ශේෂ එකතුව රු.8,414,141ක් වූ අතර එම ශේෂ අයකර ගැනීමට හෝ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

---------------------------------------------------------------

2015 ජුනි 17 දිනැති අංක පීඊඞී 3/2015 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2.8 ඡේදයේ සඳහන් අමතර දීමනා හැර අනෙකුත් දීමනා සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශයේ නිර්දේශ මත මුදල් විෂය භාර අමාත්‍යාංශයේ එකඟතාව ලබා ගත යුතුය. එහෙත්, අනුමැතියකින් තොරව සමාගමේ සභාපති හා විධායක අධ්‍යක්ෂවරයා වැඩබිමට පැමිණීම වෙනුවෙන් දෛනිකව රු.2,000 ක් වශයෙන් සමාලෝචිත වර්ෂයේදී පැමිණීමේ දීමනා ලෙස රු.352,000ක් ගෙවා තිබුණි.

**2.5 නීති රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

------------------------------------------------------------------------

පහත සඳහන් නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | **නීති රීති රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම්** |
|---|---|---|
| (අ) | 2015 මැයි 25 දිනැති අංක පීඊඩී1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | චක්‍රලේඛයෙන් ආවරණය නොවන නිලධාරීන් 09 දෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.138,000 ක ප්‍රවාහන දීමනාවක් ගෙවා තිබුණි. |
| (ආ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව නිකුත් කරන ලද 19 වෙනි අතිරේකය | මෝටර්රථ හා උපකරණ අළුත්වැඩියා වියදම රු.200,000 ඉක්මවන්නේ නම් අමාත්‍යාංශ ලේකම්ගේ පෞද්ගලික අනුමැතිය ලබා ගත යුතු වුවත්, ඊට අනුකූල නොවන ලෙස අවස්ථා 03කදී රු. 3,502,931 ක අළුත්වැඩියාවන් සිදුකර තිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

------------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

-----------------

ඉදිරිපත් කරන මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය රු. 10,533,931 ක අලාභයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ලාභය රු.26,586,534 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.37,120,465 ක පිරිහීමක් විය. ඉකුත් වසරට සාපේක්ෂව පරිපාලන පොදු කාර්ය වියදම් රු. 23,098,023 කින් හා ආදායම් බදු රු. 55,780,952 කින් අඩු වී තිබුණ ද දළ ලාභය රු.125,627,433 කින් පහළ යෑම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 03ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී, 2013/2014 මූල්‍ය වර්ෂයෙහි රු.134,385,026 ක් වූ අතිරික්තය 2015/2016 වර්ෂයේදී රු.26,586,834ක් දක්වා පිරිහී සමාලෝචිත වර්ෂය අවසානයට රු. 10,533,931ක අලාභයක් බවට පත්වී තිබුණි. මූල්‍ය ප්‍රතිඵලයට රාජ්‍ය බදු, සේවක

පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී 2013/2014 වර්ෂයේ රු.338,932,189 ක් වූ සමාගමේ දායකත්වය 2015/2016 වර්ෂයේදී රු.293,879,067 ක් හා සමාලෝචිත වර්ෂයේදී රු.255,409,411 ක් දක්වා අඛණ්ඩව පහල යාමක් නිරීක්ෂණය විය.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගමේ ප්‍රධාන නිෂ්පාදනවල දායකත්වය ඉකුත් වර්ෂ දෙක සමග සසඳා පහත දැක්වේ

| නිෂ්පාදනය | 2016/2017 දායකත්වය | 2015/2016 දායකත්වය |
|---|---|---|
| | රු. | රු. |
| ඊ ආර් පී | 263,439,441 | 424,242,325 |
| එච් ඊ ආර් පී | 78,840,900 | 92,069,620 |
| පොල් පොහොර | 23,813,360 | 46,424,398 |

ඊ ආර් පී හා එච් ඊ ආර් පී නිෂ්පාදනයන් ගෙන් ලැබුණු දායකත්වය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රු.174,031,604 කින් හෙවත් සියයට 34 කින් අඩුවී තිබූ අතර පොල් පොහොර නිෂ්පාදනයෙන් ලැබුණු දායකත්වය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රු.22,611,038 කින් හෙවත් සියයට 49 කින් අඩුවී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ විකුණුම් ආදායම විශාල ලෙස පහළ යාම හේතු කරගෙන සමාගමේ සාමාන්‍ය කොටසක ඉපයීම 3.67 සිට සෘණ 1.45 දක්වා අඩුවී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ සමාගම විසින් රු.මිලියන 25 ක් වූ ස්ථාවර තැන්පතු ආපසු ලබාගෙන තිබූ අතර රු. මිලියන 25 ක් වූ බැංකු ණය මුදලක් ස්ථාවර තැන්පතු ඇපයට තබා ලබාගෙන තිබුණි.මෙම මුදලින් රු.24,979,533 ක ණය මුදලක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ගෙවිය යුතුව තිබුණි. ප්‍රධාන ව්‍යාපාරික කටයුතු මගින් ආදායම් ඉපැයීමේ හැකියාව ක්‍රමයෙන් පහළයාම මෙම තත්ත්වයට බෙහෙවින් හේතුවී තිබූ අතර ඒ අනුව, මෙහෙයුම් කටයුතු පවත්වා ගැනීමට තරම්වත් ප්‍රමාණවත් ආදායම් මට්ටමක් පවත්වා ගැනීමට නොහැකි වීමේ අවධානමකට සමාගම මුහුණ දී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

බහු වාර්ගික භෝග සඳහා පොහොර වශයෙන් යොදා ගන්නා පොස්පේට් කැනීම් සිදු කිරීම හා අලෙවි කිරිම අරමුණු කරගෙන 1992 වර්ෂයේ ආරම්භ කරන ලද ලංකා පොස්පේට් සමාගම විසින් මූලික ස්වරූපයේ නිෂ්පාදන 02ක් (ඊආර්පී/ එච්ඊආර්පී) හා තව දුරටත් මූලික ස්වරූපයේ නිෂ්පාදනයක් වූ පොල් පොහොර නිෂ්පාදනය පමණක් වර්තමානය වන විට සිදු කරනු ලැබේ. ඊආර්පී පොහොර තේ, රබර්, පොල් වැනි දීර්ඝ කාලීන භෝග සඳහාත් එච්ඊආර්පී පොහොර කුරුඳු, ගම්මිරිස් වැනි සුළු අපනයන භෝග සඳහාත් යොදා ගනු ලැබේ.

සමාගමේ කාර්ය සාධනය සම්බන්ධයෙන් සිදුකල පරීක්ෂාවේදි පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ලංකාවේ ප්‍රධාන කෘෂි භෝගය වන වීවගාව සඳහා ඉහත පොහොර වර්ග යෙදිය නොහැකි වුවද, වී සඳහා යොදන ත්‍රිත්ව පොස්පේට් වැනි රසායනික පොහොර නිෂ්පාදනය සඳහා මෙම ඛණිජය යොදා ගත හැකිය. එසේ වුවද, ඒ සඳහා අවධානය යොමු කර නොතිබුණු අතර ලංකාව තුළ ස්වාභාවික සම්පත් තිබියදී වාර්ෂිකව ත්‍රිත්ව සුපර් පොස්පේට් ආනයනය වෙනුවෙන් විශාල වශයෙන් විදේශ විනිමය පිටරටට ගලා යාමක් සිදුවන බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) ඇපටයිට් ඛනිජය භාවිතයෙන් සිදුකළ හැකි වෙනත් නිෂ්පාදන හා එම ඛනිජය යොදා ගත හැකි අවස්ථාවන් පහත පරිදි වූ නමුත් එම අවස්ථාවන් සමාගම විසින් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(i) සත්ත්ව ආහාර නිපදවීම
(ii) ජල මෘදු කාරක ද්‍රව්‍ය නිපදවීම
(iii) විද්‍යුත් ආලේපන කටයුතු
(iv) පිඟන් භාණ්ඩ නිෂ්පාදනය
(v) තීන්ත වර්ග නිෂ්පාදනය
(vi) රබර් කර්මාන්තයේදී භාවිතයට ගත හැකි වීම

(ඇ) සමාගමේ සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ නිෂ්පාදනය හා විකුණුම් පහත පරිදි විය.

| විස්තරය | 2015/2016 | | 2016/2017 | |
|---|---|---|---|---|
| | නිෂ්පාදනය (මෙ.ටො) | විකුණුම් ප්‍රමාණය (මෙ.ටො) | නිෂ්පාදනය (මෙ.ටො) | විකුණුම් ප්‍රමාණය (මෙ.ටො) |
| ERP | 45216 | 47,144 | 28318 | 27,736 |
| HERP | 8446 | 7,961 | 6497 | 6,784 |
| මුළු නිෂ්පාදන විකුණුම් (මෙ.ටො) | 53662 | 55,105 | 34815 | 34,520 |
| මුළු නිෂ්පාදන පිරිවැය හා මුළු විකුණුම් වටිනාකම (රු.) | 214,697,465 | 515,851,225 | 253,160,119 | 341,510,811 |

ඊ ආර් පී හා එච් ඊ ආර් පී නිෂ්පාදනය ඉකුත් වර්ෂයට සාපේක්ෂව මෙට්‍රික් ටොන් 18,847 කින් හෙවත් සියයට 35 කින් අඩුවී තිබුණද, සමස්ත නිෂ්පාදන පිරිවැය සියයට 15 කින් පමණක් අඩුවී තිබුණි. සමස්ත නිෂ්පාදන පිරිවැය අඩු වී තිබුණ ද ඒකකයක නිෂ්පාදන පිරිවැය වැඩි වී තිබූ අතර සේවක වැටුප් ඇතුළුව අනෙකුත් ස්ථාවර වියදම් ඉහළයාම, අධික නඩත්තු වියදම් හා රජයේ විවිධ ආයතන විසින් කැණීම් කටයුතු වෙනුවෙන් අයකරන බදු මුදල් හේතුවෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව අමුද්‍රව්‍ය

මෙ.ටො. ඒකකයකට අන්තර්ග්‍රහණ නිෂ්පාදන පිරිවැය රු. 439 කින් ඉහළ යාම ඒ සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. ඉහත තත්ත්වයන් මත සමාගම දැනටමත් මූල්‍යමය පාඩුවක් ලබා ඇති බැවින් ඉදිරියේදී මෙම තත්ත්වය තවත් වර්ධනය විය හැකි අතර භාණ්ඩාගාරය වෙත ලාභාංශ ගෙවීමේදී දුෂ්කරතා මතුවිය හැකි බව නිරීක්ෂණය විය. ඒ අනුව, මූලික ස්වරූපයේ නිෂ්පාදන මතම නොරැඳී දේශගුණික හා රාජ්‍ය ප්‍රතිපත්ති වෙනස්වීම්වලට මුහුණ දිය හැකි වන පරිදි රාජ්‍ය අනුග්‍රහය ඇතිව එකතු කල අගය නිෂ්පාදනයක් කරා කඩිනමින් ගමන් කිරීම කළ යුතු බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(ඈ) නිෂ්පාදනය, අලෙවිය වැඩි කිරීම, නව වෙළඳ පොල අවස්ථා ලබා දීම, විදේශ විනිමය ඉතිරි කිරීම, නව පර්යේෂණ සිදුකිරීම හා උසස් සේවාවක් සැපයීම යන කාර්යයන් අරමුණු කරගෙන ක්‍රියාකාරී සැලැස්ම සකස් කර තිබුණ ද එහි ඇතුළත් කිසිදු ක්‍රියාකාරකමක ප්‍රගතිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------------

මාසික අලෙවිය හා නිෂ්පාදනය මත පදනම්ව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබූ දෛනික විශේෂ දීමනා අනුපාත ඉහළ නිලධාරීන්ට ඉහළ අගයක්ද, පහළ නිලධාරීන්ට පහළ අගයක්ද ගෙන තිබුණි. ඒ අනුව, ඉහළ නිලධාරීන්ට රු.1,115 සිට රු.2,387 දක්වා රේටයන් හා නිෂ්පාදනයට සෘජුවම දායකවන පුද්ගල කණ්ඩායමට රු.333 සිට රු.462 ක් වැනි අඩු රේටයන් ගෙවීම් කිරීම හේතුවෙන් එය ශ්‍රමිකයන්ගේ කාර්යක්ෂමතාවය කෙරෙහි සෘජුවම බල පෑ හැකි බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 4.3 නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්

-------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගම විසින් 2008 වර්ෂයේදී මිලදී ගෙන තිබූ රු.7,901,000ක් වටිනා විල්ලෝඩරය යන්ත්‍ර පැය 14,349 ක් කැණීම් කටයුතු සඳහා භාවිතා කිරීමෙන් පසු අක්‍රිය වී තිබුණි. 2015 හා 2016 වර්ෂයන් තුළදී මෙම යන්ත්‍රය අළුත්වැඩියාව වෙනුවෙන් රු.4,243,799ක් වැය කර තිබුණද 2015 වර්ෂයේ සිට විගණිත දිනය වූ 2017 ජුනි දක්වා භාවිතයෙන් තොරව නිෂ්ක්‍රීයව පැවතුණි. මේ හේතුවෙන් විල්ලෝඩර් යන්ත්‍ර කුලී පදනම මත ලබා ගැනීමට සිදු වීම නිසා 2015 හා 2016 වර්ෂයන් තුළ රු.3,467,893ක මුදලක් බාහිර පාර්ශවයන්ට ගෙවා තිබුණි.

(ආ) එප්පාවල පරිශ්‍රයේ නව මිල් යන්ත්‍රයක් ස්ථාපිත කිරීම වෙනුවෙන් අමතර කොටස් මිලදී ගැනීම සඳහා 2014 වර්ෂයේ දී රු.43,453,115 ක් වැය කර තිබුණි. එම අමතර කොටස් අතුරින් රු. 17,234,953 ක් වටිනා අමතර කොටස් වෙනත් යන්ත්‍ර සඳහා භාවිතා කර තිබූ අතර ඉතිරිව පැවති රු. 26,218,162 ක් වටිනා අමතර කොටස් මිලදී ගත් දින සිට මෙම වාර්තාවේ දින වන විටත් භාවිතයකින් තොරව ගබඩාවේ පැවතුණි. එයින් රු 11,513,434 ක් වූ TGM 160 main mill අමතර කොටස කිසිදු යන්ත්‍රයකට යොදාගත නොහැකි බව විගණනයේදී අනාවරණය විය.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණක ලෙස නිළධාරියෙකු අනුයුක්ත කර තිබුණද අභ්‍යන්තර විගණන සැලැස්මට අනුකූල ලෙස ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්.

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | තොග පාලනය | අමු ද්‍රව්‍ය තොග වටිනාකම ගණනය කිරීම සඳහා නිශ්චිත ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබීම. |
| (ආ) | මූල්‍ය පාලනය | ඉහළ වටිනාකම් පවතින ගනුදෙනුවලට අදාළව ගෙවීම් කිරීමට ප්‍රථම අභ්‍යන්තර විගණන අංශය ලවා පරීක්ෂාවක් සිදු කර නොගැනීම. |
| (ඇ) | ණයගැති පාලනය | ණයගැතියන් ගෙන් ලැබිය යුතු මුදල් අප්‍රමාදව අයකර නොගැනීම හා ඒවා නිවැරදිව ගිණුම් ගත නොකිරීම. |
| (ඈ) | ගිණුම්කරණය | ජර්නල් සටහන් යෙදීම සඳහා විධිමත් පරිදි අධිකාර බලය පවරා නොතිබීම. |